දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :01/2024

මගේ අංක- සමු/අධි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප),
ආදිපාද වීදිය, කොළඹ 01.
2024.05. 15

**බස්නාහිර පළාත් සියළුම විවිධ සේවා සමුපකාර සමිති, මූල්‍ය සේවා සමුපකාර සමිති සහ සමුපකාර සංගම්වල ගරු සභාපතිවරුන් හා සාමාන්‍යාධිකාරිවරුන් වෙත.**

**<u>සමුපකාර ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් සඳහා සුදුසු ආයෝජන කළඹ සහ ආයෝජනයන් සිදු කිරීමේ ක්‍රියා පටිපාටිය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2018.05.09 දිනැති අංක 2018/01 චක්‍ර ලේඛය මෙම චක්‍රලේඛය මඟින් අවලංගු කරනු ලැබේ.

01. සමුපකාර ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්වල මූල්‍ය ආයෝජනයන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි සිදු කළ යුතු ය.

02. එකී සමුපකාර සමිති/ සංගම්වල තැන්පත්කරුවන්ගේ තැන්පත් මුදල්වල ආරක්ෂාව සලසමින් මූල්‍ය සුරක්ෂිතතාව, ලාභදායීත්වය සහ ද්‍රවශීලතාව පවත්වා ගනිමින් ආයතනික තිරසාරත්වය ආරක්ෂා කර ගැනීම සඳහා සඵලදායී අයුරින් ආයෝජනයන් සිදු කළ යුතු ය.

03. සමිතියේ සාමාජික හා සාමාජික නොවන තැන්පත් වටිනාකමෙන් අවම වශයෙන් 60% ණය, අත්තිකාරම් සහ උකස් කටයුතුවල ආයෝජනය කළ යුතු අතර යම් සමිතියක් එම සීමාව දක්වා ණය, අත්තිකාරම් සහ උකස් කටයුතුවල ආයෝජනය කර නොමැති නම් එම සීමාව දක්වා ඉතිරි මුදල රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කල යුතුයි. ඊට අමතරව සමාජික හා සමාජික නොවන තැන්පත් වලින් ඉතිරි 40% න් අවම වශයෙන් 30% රාජ්‍ය බැංකුවල ආයෝජනය කල යුතුය.

04. සෑම ආයෝජනයක්ම විචක්ෂණශීලීව සිදු කළ යුතු ය. විවිධ ආයෝජනයන්ගේ අවධානම, ඉපයුම් සහ පරිණතිය මෙන්ම ආයෝජනය කරනු ලබන මූල්‍ය උපකරණවල සහ ආයතනයන්ගේ යථායෝග්‍යතාව පිළිබඳව අවධානය යොමු කරමින් තැන්පත්කරුවන්ගේ අරමුදල් බාහිර පාර්ශවයන්හි ආයෝජනය කිරීම අදාල සමුපකාර සමිති/ සංගම් කළමනාකාරීත්වයේ පූර්ණ සහ සාමූහික වගකීමක් වේ.

05. අතිරික්ත අරමුදල් ආයෝජනයේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් සහ ක්‍රියාපටිපාටි

5.1 සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් ආයෝජන කිරීමේ දී ඇමුණුම් අංක 01හි සඳහන් ආයෝජන සීමාවන්ට අනුකූල විය යුතු ය.

5.2 සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්වල අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමේ දී වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුවක් (Assets and Liability Management Committee - ALCo) හෝ ආයෝජන සහ අවදානම් කළමනාකරණ කමිටුවක් (Investment and Risk Management Committee) පත් කළ යුතු අතර, එම කමිටුවේ නිර්දේශයන් මත අධ්‍යක්ෂ මණ්ඩලය/ කාරක සභාව විසින් ආයෝජන සම්බන්ධ තීරණයන් ගත යුතු ය. ආයෝජන පිළිබඳව පසු විපරම් කිරීමක් මෙම කමිටුවෙන් සිදු කළ යුතු ය.

5.3 මෙම කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතු ය.

I. සමුපකාර සමිති/ සංගමයේ සභාපති හෝ උප සභාපති
II. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්/භාණ්ඩාගාරික
III. ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී
IV. මූල්‍ය කළමනාකරු/ ගණකාධිකාරී/කළමනාකරු
V. බැංකු සේවා කළමනාකරු

සමුපකාර සමිති/ සංගමයේ ලේකම්වරයා මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළ යුතු වේ.

5.4 . මෙම කමිටුවේ තීරණයන් සහිත වාර්තාවක් ආසන්නම දිනකදී පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභා රැස්වීමට කමිටු ලේකම් විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම රැස්වීමේ දී ඉහත කමිටු තීරණයන් පිළිබඳ අනුමැතිය සහ එම සාමාජිකයන්ගේ අදහස් සහ නිරීක්ෂණයන් විස්තරාත්මකව ඉදිරිපත් කළ යුතු ය.

5.5 . ආයෝජනයන් සිදු කිරීමේ දී අදාල ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන අධික පොලී අනුපාත, වෙනත් මූල්‍ය නොවන ප්‍රතිලාභ සහ කමිටු සාමාජිකයන්ගේ පෞද්ගලික සබඳතා පිළිබඳව සැළකිලිමත් නොවී හුදෙක් ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභ, ආයෝජන අවදානම් තක්සේරුව සහ පරිණතියේ දී ආයෝජිත මුදල සහ ප්‍රතිලාභය මුදලින් ආපසු ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු විය යුතු ය.

06. ආයෝජනය කළ හැකි ආයතන

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි ආයෝජන කරන ආයතනයේ ද්‍රවශීලතාවය හා එහි ආබණ්ඩ පැවැත්ම පිළිබද සැලැකිළිමත් වෙමින් 2011 අංක 04 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරණ බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 41 (1) වගන්තියේ විධිවිධාන වලට යටත්ව පමණක් ආයෝජන සිදු කල යුතුය.

6.1 සියලුම රාජ්‍ය බැංකු සහ රජයේ පූර්ණ හිමිකාරිත්වය ඇති විශේෂිත බැංකු

6.2 බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත පෞද්ගලික බැංකු

6.3 රජය සතු බලපත්‍රලාභී මූල්‍ය සමාගම්

6.4 පහත දැක්වෙන කොන්දේසි සහ උපදෙස්වලට අනුකූලව සමුපකාර මූල්‍ය සේවා සමිති/ සංගම්වල ආයෝජනයන් සිදු කල හැකිය.

I. ආයෝජන මුදල් භාරගනු ලබන මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගමයේ ආයෝජනය සිදු කරන දිනට ආසන්න කාර්තු දෙකෙහි මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තාව අනුව ක්‍රියාකාරී මූල්‍ය වත්කම් අතිරික්තයක් පැවතිය යුතු ය. (ක්‍රියාකාරී මූල්‍ය වත්කම් අතිරික්තය = ක්‍රියාකාරී මූල්‍ය වත්කම් - ක්‍රියාකාරී මූල්‍ය වගකීම්)

II. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි, මූල්‍ය සේවා කටයුතු වල නිරත සමුපකාර සමිති/ සංගම්වල ආයෝජන කළඹේ ව්‍යුහය සහ අවදානම් තත්ත්වය පිළිබඳව අවධානය යොමු කළ යුතු ය. (දැනට ආයෝජන සිදු කර ඇති ස්ථාන සහ මූල්‍ය උපකරණවල ලැයිස්තුවක් ලබා ගෙන ඒවායේ උපලබ්ධි වටිනාකම් සහ ද්‍රවශීලතාව තහවුරු කර ගත යුතු ය.)

6.5 ආසන්න කාර්තු දෙකක මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තා අනුව මූල්‍ය වත්කම් අතිරික්තයක් රහිත සමිති සියලුම ආයෝජන රාජ්‍ය බැංකුවල පමණක් සිදු කල යුතුය.

07. ආයෝජනය නොකළ යුතු ආයතන

- පෞද්ගලික මූල්‍ය සමාගම්
- ඒකකභාර ආයතන
- ක්ෂුද්‍ර මූල්‍ය ආයතන
- පෞද්ගලික සමාගම්
- වෙනත් රාජ්‍ය නොවන සංවිධාන

08. ආයෝජනය නොකළ යුතු ආයතන/ මූල්‍ය උපකරණ

- ව්‍යපාර වස්තු (Stocks)
- පෞද්ගලික බැදුම්කර (Private Bonds)
- වාණිජ පත්‍රිකා (Commercial Papers)
- ඒකකභාර (Unit Trust)
- බන්ධිත/ භාරකාරීත්ව බැදුම්කර (Trust Bonds)

09. භාණ්ඩගාර බිල්පත්,භාණ්ඩකාර බැදුම්කර සහ මහ බැංකු සුරකුම්පත්වල ආයෝජන කල යුත්තේ රාජ්‍ය බැංකු වලට අයත් වන ප්‍රථමික අලෙවිකරුවන් හරහා පමණි.

10. සමුපකාර සමිති/ සංගම් හී ආයෝජන කළඹ මාස තුනක කාලයක් ඇතුළත මෙම චක්‍රලේඛය අනුව සකසා ගැනීම සිදු කළ යුතු ය.

11. මෙම චක්‍ර ලේඛනයේ විධිවිධාන උල්ලංඝනය කරමින් සිදු කරන අයෝජන නිසා සමිතියට සිදුවන අලාභයකට හා පාඩුවකට හෝ සමිතිය යටත් වන දඩුවමකට 1973 සමුපකාර රීති මලාවේ 26 වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය හා සේවකයන් තනිව හා සාමූහිකව වගකිමට බැදෙන බවත් එබඳු අවස්ථාවක සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 හා 66 වගන්ති යටතේ ක්‍රියා කර සමිතියට සිදුවන මූල්‍ය හානිය පියවා ගත යුතු බවත් කාරුණිකව දන්වමි.

එම්. ඒ. පි. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (වැ.බ.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

පිටපත් :

| | | | |
|---|---|---|---|
| i. | ලේකම් ,සමුපකාර හා ප්‍රවාහන අමාත්‍යාංශය | - | කරු.දැ.පි. |
| ii. | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ( කොළඹ,ගම්පහ,කළුතර) | - | කරු.දැ.පි.හා අදාළ නිළධාරීන් හා දිස්ත්‍රික්කයේ සියළු සමුපකාර සමිති දැන්වත් කිරීමට |

**ඇමුණුම 01**

**ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් සඳහා**

**ආයෝජන කළඹ**

- මුළු තැන්පත් 30% අවමයක් රාජ්‍ය බැංකුවල සඳහා ආයෝජනය කිරීමෙන් පසු ඉතිරිය පහත අයුරින් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය.

| **අනු අංකය** | **අයිතමය** | **නිර්දේශිත වටිනාකම** |
|---|---|---|
| 01 | බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත පෞද්ගලික බැංකුවල තැන්පතු සහ රජය සතු බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ආයෝජන | උපරිමය 60% |
| 02 | මූල්‍ය සේවා කටයුතුවල නිරත සමුපකාර සමිති හා සංගම්වල ආයෝජන (ආසන්න කාර්තු දෙකක මූල්‍ය අතිරික්තයක් පවතින යන්න පරික්ෂා කර බලා) සහ සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතියලත් අභ්‍යන්තර/ බාහිර ව්‍යපෘතිවල ආයෝජන | උපරිමය 60% |

- ඉහත 1 හා 2 අවස්ථාවලදී එක් ආයතනයක ආයෝජනය කල හැකි උපරිම අගය නිර්දේශිත වටිනාකමෙන් 20% කට සීමා විය යුතුය.

ඇමුණුම් අංක 02

**අතිරික්තය ගණනය කිරීම**

මෙම වාර්තාව මූල්‍ය තත්ව විශ්ලේෂණ වාර්තාව ඇසුරින් සකස්කල යුතු වේ.

**සීමාසහිත/ සීමාරහිත................ සමිතිය/ සංගමයේ,**

**2023........... දිනට**

**ආයෝජන කළඹ සඳහා මූල්‍ය අතිරික්ත වාර්තාව**

| මූල්‍ය තත්ව විශ්ලේෂණ වාර්තාවේ සටහන් අංකය | විස්තරය | ආයෝජනය කලයුතු ප්‍රතිශතය | ආයෝජනය කරඇති ප්‍රතිශතය | (සියලුම වටිනාකම් රුපියල් වලිනි) | |
|---|---|---|---|---|---|
| 2.1 | සාමාජික හා සාමාජික නොවන තැන්පත් | | | | ****** |
| | අඩු කලා: | | | | |
| 1.2 | රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන සහා රජයේ පූර්ණ හිමිකාරීත්වය ඇති වාණිජ හා විශේෂිත බැංකුවල ආයෝජන | 30 | | ****** | (******) |
| | | | | | ****** |
| | අඩු කලා: | | | | |
| 1.3 | සාමාජික ණය | 60% | | ****** | |
| 1.4 | උකස් අත්තිකාරම් | | | | |
| | | | | | (******) |
| | | | | | ****** |
| | එකතු කලා: | | | | |
| | අනෙකුත් අරමුදල් | | | | |
| 2.2 | බැංකු හා බාහිර ණය | | | ****** | |
| 2.3 | වෙනත් මූල්‍ය වගකීම් | | | ****** | |
| 5.1 | වෙනත් වගකීම් | | | ****** | |
| 6.3 | වත්කම් අතිරික්තය | | | ****** | ****** |
| | | | | | ****** |
| | අඩු කලා: | | | | |
| | ආයෝජනය වී ඇති ආකාරය | | | | |
| 1.1 | මුදල් හා මුදල් සමානයන් | | | ****** | |
| 1.3 | සාමාජික ණය | | | ****** | |
| 1.4 | උකස් අත්තිකාරම් | | | | |
| 1.5 | වෙනත් මූල්‍ය වත්කම් | | | ****** | |
| 4.5 | මුළු වෙනත් වත්කම් | | | ****** | (******) |
| 1.2 | **01/2024 චක්‍රලේඛයේ සඳහන් ආයෝජන කළඹ අනුව ආයෝජනය කළ හැකි අතිරික්ත වටිනාකම** | | | | ****** |

ඉහත කොරතුරු සහ සංඛ්‍යා නිවැරදි බවට සහතික කරමු.

............................................. ..............................................

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී/ කළමනාකරු

ගණකාධිකාරී/සහය කළමණාකරු